# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1321/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 14/08/2024 පැය 1515

**මාධ්‍ය නිවේදනය**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.08.13 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මිහිජයසෙවණ පොලිස් වසමේ ශාන්ත ජෝෂප් වීදිය ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **අයිස් මත් ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 280ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කළුවාංචිකුඩි පොලිස් වසම.**

2024.08.13 වන දින රාත්‍රී කාලයේ කළුවංචිකුඩි පොලිස් වසමේ ඔන්දච්චිමඩම් කරුමනවෙලි මාර්ගයේ මහුලූර් පාසල ආසන්නයේදී මලුහූර් පාසල දෙස සිට කරුමන්වෙලි දෙසට ධාවනය වූ යතුරුපැදියක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගයේ වම්පස තිබූ විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු තුවාල ලබා කළුවාංචිකුඩි රෝහලට ඇතුළත් කිරීමේදී මිය ගොස් ඇත. මෙම අනතුරට ලක්වූ යතුරුපැදියේ පසුපැදිකරු කළුවංචිකුඩි රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහලට ඇතුලත් කරන ලදි.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ කරුමන්වෙලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුවංචිකුඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කළුවංචිකුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**